# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශේෂ    அதிவிசேஷமானது    **EXTRAORDINARY**

**අංක 883/6 – 1995 අගෝස්තු 09 වැනි බදාදා – 1995.08.09**

**883/6 ஆம் இலக்கம் — 1995 ஆம் ஆண்டு ஓகத்து மாதம் 09 ஆம் திகதி புதன்கிழமை**

**No. 883/6 – WEDNESDAY, AUGUST 09, 1995**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)    (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)    **(Published by Authority)**


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 21/78 III

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (I) වන වගන්තිය යටතේ නියමය

1995 අංක 1 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය, රිචර්ඩ් පතිරණ වන මම, එකී පනතේ 21 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් ලෙස එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාර සලකනු ලබන ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් කරන ලද (මෙහි මින් මතු "අදාළ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත ඒ අදාළ නියමයේ දක්වා ඇතැයි සලකනු ලබන පීඨවලට, මෙහි උපලේඛනයෙහි සඳහන් අධ්‍යයන අංශවලින් සමන්විත වන වෛද්‍ය පීඨය 1989 මැයි මස 02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කිරීමෙන්, මේ නියමය මගින් සංශෝධනය කරමි.

---

රිචර්ඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

වර්ෂ 1995ක් වූ අගෝස්තු මස 07 වන දින,
කොළඹ දී ය.

උපලේඛනය

1. ව්‍යුහ විද්‍යා අධ්‍යයන අංශය
2. කායික විද්‍යා අධ්‍යයන අංශය
3. ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය
4. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය
5. පරපෝෂ විද්‍යා අධ්‍යයන අංශය
6. ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය
7. ඖෂධ විද්‍යා අධ්‍යයන අංශය
8. අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය
9. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය
10. වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය
11. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය
12. ධාත්‍රීකෘත්‍ය හා නාරී වේද අධ්‍යයන අංශය
13. ළමා රෝග විද්‍යා අධ්‍යයන අංශය
14. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය


08 – 567

1A – D 037544 – 1,060 (95/08)